**ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්විමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

---

(අ) **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 2021/03 හි 7.6 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන ඍජු ක්‍රමයට පිළියෙල කළයුතු වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හරස් සටහන් රහිතව දැක්වීම හේතුවෙන් රු.3,157,959 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි අගයන් ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.159,870 ක්, රු.150,700 ක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | 2020.12.19 දින මියගිය බී. එස්. ඩී. ප්‍රේමසුන්දර මහතාගේ රු. 159,870/= ක ණය ශේෂය මරණ පාරිතෝෂිතයෙන්ද 2021.12.31 දින විශ්‍රාම ගොස් ඇති එම්.ඒ. ජයසිංහ මයාගේ රු. 150,700.00ක මුදල මෙම වර්ෂය තුළදී විශ්‍රාම පාරිතෝෂිතයෙන්ද අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සේවය හැර ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 211,486 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඒ තුළ වර්ෂ 05 ට වැඩි රු.179,740 ක ණය ශේෂයක්ද අන්තර්ගත වී තිබුණි. | 1997 වර්ෂයේදී සේවය හැර ගිය ඕ.සී.එල්. සිල්වා මහතාගේ රු. 123,475ක මුදලත්, 2001 වර්ෂයේදී සේවය හැර ගිය එම්.ආරියරත්න මහතාගේ රු. 56,265ක මුදලත් අය කර ගැනිම සම්බන්ධයෙන් තොරතුරු සහ ලේඛන පිටපත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර අදාළ උපදෙස් ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. ආපදා ණය ශේෂය වූ රු. 31,746 ක මුදල 2022 මාර්තු මස ගිණුම් ශීර්ෂ මගින් නිරවුල් කර ඇත. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලිනව පවත්වා ගෙන ගොස් නොතිබුණි | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කරමින් පවතියි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 09 ක රු.27,150,000ක ප්‍රතිපාදනයන් මු.රෙ. 66 මගින් වෙනත් වැය විෂයයන්වලට මාරු කිරීමෙන් පසුද රු.82,193,819ක් ඉතිරිවී තිබුණි. | කොවිඩ් 19 හේතුවෙන් ප්‍රචාරක වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක නොවීම, දෙපාර්තුමේන්තුව සතු වාහන කළමනාකරණය තුලින් අවශ්‍යතා ඉටුකර ගැනීම, නිලධාරීන් ස්ථාන මාරුවීම, වවුචර් ඉදිරිපත් නොවීම හා අවශ්‍යතා ඇති නොවීම, බලාපොරොත්තු වූ පරිදි නඩත්තු කටයුතු නොවීම, නව ගොඩනැගිලි ඉදි කිරීම අත්හිටුවීම ප්‍රතිපාදන ඉතිරියට බලපා ඇත. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව සකස් කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ වැය විෂයයන් 07 ක එකතුව රු. 1,162,393 ක් වටිනා බැරකම් 15 ක් 2022 වර්ෂයේ පෙබරවාරි අවසන් වන විටද පියවීමට කටයුතු කර නොතිබුණි. | දුරස්ථ අධ්‍යාපන ආයතනය වෙත 2022.04.01 දින රු. 40,000 ක මුදල , 210 – 02 – 2401 වැය විෂය යටතේ ගෙවීම් කටයුතු කර ඇත. ඉතිරි බැරකම් මේ වන තෙක් ගෙවීමට ඉදිරිපත් වී නැත. | බැරකම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ඉකුත් වර්ෂයේ රු. 763,252 ක් වූ බැරකම් 06 ක් 2022 වර්ෂයේ වැය ලෙජරවල සටහන් කිරීමේදී පෙර වර්ෂවල ගිණුම්ගත බැදීම් ලෙස සටහන් නොකර පවත්නා වර්ෂයේ ගිණුම්ගත බැදීම් ලෙස දක්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදියි. වැය ලෙජරය නිවැරදි කිරීමට කටයුතු කරමි. | බැදීම් නිවැරදිව සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II කාණ්ඩයේ | - | ප්‍රවාහන අංශයේ රාජකාරී කළ කාලසීමාව තුළ වාහන අලුත්වැඩියාවේදී සහ වාහන ලිපිගොනු පවත්වාගෙන යාමේදී සිදුකර ඇතැයි පැවසෙන අක්‍රමිකතා | ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක MMI/AD/2/1/-vol iහා 2021.09.23 දිනැති ලිපිය මගින් නිලධාරිනිය සම්බන්ධයෙන් | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **XLVIII පරිච්ඡේදයේ 4.1 වගන්තිය අනුව 2:2:1 වැනි උප වගන්තිය** | | සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමට යටත්ව ප්‍රවාහන අංශයේ නිලධාරිනියක් 2021 නොවැම්බර් 23 දිනැති රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් තාවකාලිකව ද්විතීය පදනම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත මුදාහැර තිබුණ ද 2022 මාර්තු 03 දක්වා එවැනි විමර්ශනයක් සිදුකර නොතිබුණි. එසේම වාහන අලුත්වැඩියා හා සේවා කිරීම් අනුමත කරන අධ්‍යක්ෂ (පාලන) 2021 ඔක්තෝබර් 26 දින වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත මාරු කර තිබූ අතර ප්‍රවාහන අංශයේ ලිපිගොනු භාර කළමනාකරණ සේවා නිලධාරිනිය ද්විතීය පදනම මත ද විමර්ශනයකින් තොරව සේවයෙන් මුදාහැර තිබුණි. | පරීක්ෂණයක් පැවැත්වීම සඳහා තැපැල් අංශයේ නීති නිලධාරිණී, එම්.ඒ.එච්.අතුකෝරල මිය පත් කර ඇති අතර එම පරීක්ෂණය සිදු කෙරෙමින් පවතී. | යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | **(i) මු.රෙ.571** | 7,652,315 | කල් ඉකුත් වූ තැන්පතු, රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වූ විට කොන්ත්‍රාත්තු වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණු අතර වර්ෂ 12ක් පැරණි රු.7,488,595 ක තැන්පතු ඊට ඇතුළත් වී තිබුණි. | නව මාධ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතුවලට අදාළ රඳවා ගත් මුදල් පොදු තැන්පත් ගිණුමේ ඉතිරිව ඇත. අලාභ තක්සේරු කරමින් පවතී. අලාභ අය කළයුතු අයිතම 10න් 9ක් සඳහා අලාභ | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තක්සේරු කර ඇත. එක් අයිතමයක අලාභය තක්සේරු කර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ලබා දී නැත. එම වටිනාකම ලද පසු අය කිරීම සිදු කරනු ලැබේ. | |
| **(ii) මු.රෙ.802 (1)** | 2021 දෙසැම්බර් 31 වන විට දෙපාර්තමේන්තුව සතු වාහන 07 ක් මාස 3 සිට 15 දක්වා වූ කාලයක් තුළ නිෂ්කාර්යව පැවතුණි. | 2021 වසරේ කොවිඩ් රෝග ව්‍යාප්ත තත්ත්වය මත දෙපාර්තමේන්තු රාජකාරී සීමා සහිතව සිදු කළ බැවින් වාහන ධාවනය ද ගරාජය වසා තිබීම හේතුවෙන් වාහන අලුත්වැඩියාද කිරීමට නොහැකි විය. | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**
**----------------------------**

**3.1 ප්‍රසම්පාදනයන්**
**------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පරිගණක 42 ක අවශ්‍යතාවය සඳහා 2021 මැයි සහ අගෝස්තු මාසවල අවස්ථා දෙකකදී මිල ගණන් කැඳවා තිබුණු අතර, එකවර මිලදී නොගැනීම හේතුවෙන් මිල ඉහළ යාම මත පරිගණක 11 සඳහා රු.4,189,600 ක් වැඩිපුර ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තු අංශ සඳහා පරිගණක 52 ක් මිලදී ගැනීමට අධ්‍යක්ෂ ජනරාල් විසින් නිරීක්ෂණය කර තිබුණි. පරිගණක 39 ප්‍රධාන ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම කල්ගත වන බැවින් නිෂ්පාදන අංශය සඳහා හදිසි අවශ්‍යතාවයක් සේ සලකා පරිගණක 03 ක් මිලදී ගැනීම සඳහා 2021.05.24 දින මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදී. මේ අතර ප්‍රධාන ප්‍රසම්පාදන සඳහා පිළිතුර සකස් කර අවශ්‍යතාවය හඳුනා ගැනීම සිදුකර ඇතත් කොවිඩ් වසංගතය යටතේ නිලධාරීන් සේවයට කැඳවීම සීමා වීම මත කමිටු රැස්වීම් පැවැත්වීමේ ගැටළු ඇති විය. ඒ අනුව ප්‍රසම්පාදන දෙකක් යටතේ මිලදී ගැනීම නිසා ප්‍රධාන ප්‍රසම්පාදනයට වඩා අඩු මුදලකට නිෂ්පාදන අංශය සඳහා පරිගණක 03 ක් මිලදී ගැනීමට හැකියාව ලැබී ඇත. | ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේදී ආයතනයට වඩාත් වාසි සැලසෙන අන්දමින් කටයුතු කළ යුතුය. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

**--------------------------------------------------**

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2022 මැයි 31 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන අලුත්වැඩියාව සහ සේවා කිරීම් සිදු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව පරීක්ෂා කිරීම | 2022 වර්ෂයේ මාර්තු 07 දිනෙන් පසුව එවන ලද විගණන විමසුම් 06 සඳහා පිළිතුරු සකස් කරමින් පවතින අතර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වාහන ලිපි ගොනු පවත්වාගෙන යාමේදී සිදු කරන ලද අක්‍රමිකතා පිළිබඳව පරීක්ෂා කිරීම. | | විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ සේවයෙන් මුදා හැරීම් පිළිබඳ පරීක්ෂා කිරීම. | | විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම විගණනය | | විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය | | විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | මූල්‍ය විගණනය 2021 | | විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |

**4. යහපාලනය**

-----------------

**4.1 අභ්‍යන්තර විගණනය**

--------------------------

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවක් සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කළ යුතු වුවද දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයකු 2022 ජූලි වන විටත් පත්කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන තනතුරෙහි පුරප්පාඩුව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිලධාරියෙකු පත් කර එවීම මගින් සම්පූර්ණ කළ යුතු වේ. මෙම දෙපාර්තමේන්තුව කිහිප අවස්ථාවකදීම මෙම පුරප්පාඩුව පිරවීමට ක්‍රියා කරන මෙන් ලිඛිත ඉල්ලීම් ද ඉදිරිපත් කර ඇතත් සුදුසු නිලධාරියෙකු පත් කර නොමැති බව කාරුණිකව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 330 ක් තත්‍ය සේවක සංඛ්‍යාව 232 ක් වූයෙන් පුරප්පාඩු 98 ක් පැවතුණු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06ක් ඊට ඇතුළත් වී තිබුණි. | දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවයේ පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ PACIS මෘදුකාංගය හරහා යාවත්කාලීන කර ඇත. තවද ඇතැම් දෙපාර්තමේන්තුගත තනතුරුවල පුරප්පාඩු පිරවීමට අදාළ ක්‍රමවේද අනුගමනය කිරීමට යාමේදී සිදුවන ප්‍රමාදයන් නිසා පුරප්පාඩු පිරවීමට කල්ගතව ඇත. එසේම ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක MMI/5/7/Com – Vol I හා 2021.09.21 දිනැති ලිපිය මගින් 2021.09.01 දින සිට නැවත දැනුම් දෙනතුරු නව බඳවාගැනීම් තාවකාලිකව නතර කර ඇත. | පවතින කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතුය. |